# ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පරිහරණය පිළිබඳ නීති රීති



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය
# ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පරිහරණය පිළිබඳ
# නීති රීති

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පර්යේෂණ පුස්තකාලයක් වන අතර එය ඕනෑම පාඨකයෙකු හට පරිහරණය කිරීමේ හැකියාව පවතී.

## පාඨකයන් ලියාපදිංචි කිරීම



ජාතික පුස්තකාලය පරිහරණය කිරීම සඳහා පැමිණෙන සෑම පාඨකයකු විසින් ම එහි සාමාජිකත්වය ලබාගත යුතු වේ. පාඨකයන් ලියාපදිංචි කිරීම හා අදාළ අයදුම්පත් නිකුත් කිරීම පාඨක සේවා අංශයේ බිම් මහලේ ස්ථාපිත කර ඇති ප්‍රධාන කවුන්ටරයෙන් සිදු කෙරේ.

## සාමාජික ගාස්තු

| | | |
|---|---|---|
| • එක් දින සාමාජිකත්වය | රු. | 20.00 |
| • ත්‍රෛමාසික සාමාජිකත්වය | රු. | 100.00 |
| • වසරක සාමාජිකත්වය | රු. | 350.00 |
| • යාවජීව සාමාජිකත්වය | රු. | 1 000.00 |
| • ආයතනික සාමාජිකත්වය (එක් වසරක් සඳහා) | රු. | 2 500.00 |

පාඨක අභිමතයට අනුව සුදුසු කාලසීමාවක් සඳහා සාමාජිකත්වය ලබා ගත හැකි අතර නියමිත කාල සීමාව ඉකුත් වීමේ දී ගාස්තු ගෙවා සාමාජිකත්වය අලුත් කරවා ගත හැකිය.

## අනන්‍යතාව තහවුරු කිරීම

සාමාජිකත්වය ලබා ගැනීම සඳහා තම අනන්‍යතාව තහවුරු කළ යුතු අතර, ඒ සඳහා ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය හෝ සහතික කළ තම ඡායාරූපයක් ඉදිරිපත් කළ යුතුය.

## විවෘතව පවතින දින සහ වේලාවන්

සතියේ සඳුදා දින සිට සෙනසුරාදා දින දක්වා විවෘතව පවතින අතර ඉරිදා සහ රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල පමණක් වසා තබනු ලැබේ.

### වේලාවන්

සඳුදා, බදාදා, සිකුරාදා සහ සෙනසුරාදා දිනවල

පෙ. ව. 8.30 සිට ප. ව. 4.15 දක්වාත්

අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා දිනවල

පෙ. ව. 8.30 සිට ප. ව. 6.15 දක්වාත් විවෘතව පවතී

## පොත්පත් හා අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය නිකුත් කිරීම



ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පර්යේෂණ පුස්තකාලයක් බැවින් පොත්පත් ඇතුළු අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය පාඨකයින් වෙත නිකුත් කරනු ලබන්නේ විමර්ශන කටයුතු සඳහා පමණි. කිසිදු හේතුවක් නිසා ඒවා බැහැර දීමක් සිදු නො කෙරේ.

- මූලික විමර්ශන ග්‍රන්ථ එකතුව බිම් මහලේ විවෘත ප්‍රවේශ ක්‍රමය යටතේ පවතින අතර ඒවා එම මහලේ සිට පරිහරණය කළ හැකිය. අනෙකුත් සියලු ම පුස්තකාල ද්‍රව්‍ය පුස්තකාලය අභ්‍යන්තරයෙහි තැන්පත් කර තිබේ.
- 1976 වසරේ සිට මෙරට පළ වූ ජාතික පුවත්පත් හා පුස්කොළ පොත් එකතුව ද බිම් මහලේ දී විමර්ශනය කළ හැකිය.
- අනෙකුත් විෂයයන්ට අදාළ පොත්පත්, සඟරා, ගැසට් පත්‍ර, හැන්සාර්ඩ් වාර්තා ආදිය පළමු හා දෙවන මහල්වල දී විමර්ශනය කිරීමේ පහසුකම් සලසා තිබේ.
- ග්‍රන්ථ එකතු පවතින ප්‍රදේශයට ඇතුලත් විය හැක්කේ ජාතික පුස්තකාලයේ කාර්ය මණ්ඩලයට පමණි.



- පොත් හා අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු මහල් තුනෙහිම ස්ථාපිත කොට තිබෙන පරිගණක සූචි (Computer Catalogue) ආශ්‍රයෙන් පරීක්ෂා කළ හැකිය. අවශ්‍ය පොතපත හඳුනාගත් පසු පුස්තකාල ද්‍රව්‍ය ඇණවුම් පතෙහි (Call Slip) එය සඳහන් කොට කවුන්ටරයේ සිටින කාර්ය මණ්ඩලය වෙත යොමු කිරීමෙන් පසු අවශ්‍ය පුස්තකාල ද්‍රව්‍ය ලබා ගත හැකිය.
- එක් අවස්ථාවක දී පාඨකයෙකු සඳහා නිකුත් කරනු ලබන්නේ පොත් තුනක් (03) පමණක් වන අතර එම පොත් නැවත භාරදීමෙන් පසු තවදුරටත් පොත් ඉල්ලුම් කළ හැකිය.
- ලබාගත් පොතපත නිකුත් කිරීමේ කවුන්ටරය වෙත නැවත භාරදෙන තෙක් ඒවායේ වගකීම පාඨකයින් විසින් දැරිය යුතු වේ.
- පොත පත පරිශීලනය කොට නැවත පුස්තකාලයෙන් බැහැරට යන විට භාරගත් පොත් පත් සියල්ල නිකුත් කිරීමේ කවුන්ටරයට භාරදුන් බවට "පුස්තකාල ද්‍රව්‍ය ඇනවුම් පතෙහි" සහතික කරගත යුතු අතර මණ්ඩලයේ ආරක්ෂක අංශය භාරයේ තබන ලද ඔබගේ හැඳුනුම්පත ලබා ගැනීමේ දී එම ඇනවුම් පත ආරක්ෂක නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය.

## පුස්තකාල ද්‍රව්‍ය පරිහරණය



- පරිහරණය කරනු ලබන සියලුම පුස්තකාල ද්‍රව්‍යවල ආරක්ෂාව පිළිබඳ දැඩි ලෙස සැලකිලිමත් විය යුතු අතර, පිටු ඉරීම, පිටු ගැලවීම, විකෘති කිරීම, පිටු නැමීම සිදු නො කළ යුතුය.

- කිසිදු පුස්තකාල ද්‍රව්‍යයක් පුස්තකාලයෙන් බැහැරට ගෙනයාම නීති විරෝධී වේ.
- පුස්තකාලය වෙත ආහාර පාන, වතුර බෝතල්, පිහි, කතුරු, බ්ලේඩ්, ගම්, තීන්ත, ජංගම දුරකථන ආදිය රැගෙන ඒමෙන් වැළකී සිටිය යුතුය.
- දුර්ලභ පොත්පත්, පුස්කොළ පොත්, පුවත්පත් ආදිය පරිහරණයේ දී පැන්සලක් පමණක් භාවිත කළ යුතුය.

## ඡායා පිටපත් නිකුත් කිරීම



- පාඨක අවශ්‍යතා අනුව ඡායා පිටපත් නිකුත් කිරීම සිදු කෙරෙන අතර සෑම විටම ප්‍රකාශන හිමිකම් නීතියේ ඇතුළත් කොන්දේසිවලට යටත්ව ඡායා පිටපත් ලබා දීම සිදු කෙරේ. දුර්ලභ හා පැරණි පොත්පත්වල ඡායා පිටපත් ලබාදීම සිදු නො කෙරේ.
- ඡායා පිටපත් ලබා ගැනීමේ දී ඊට නියමිත ආකෘති පත්‍රය සම්පූර්ණ කර ඒ මගින් ඉල්ලීම් කළ යුතු වේ. ඡායා පිටපත් ගාස්තු පහත පරිදි වේ.

| ප්‍රමාණය | එක් දින සාමාජිකයින් සඳහා | ස්ථිර සාමාජිකයින් සඳහා |
|---|---|---|
| A4 තනි පැත්ත | රු. 6.00 | රු. 4.00 |
| A4 දෙපැත්ත | රු. 7.00 | රු. 5.00 |
| B4 තනි පැත්ත | රු. 8.00 | රු. 6.00 |
| B4 දෙපැත්ත | රු. 10.00 | රු. 8.00 |


- ඡායා පිටපත් යන්ත්‍ර කැඩී හෝ අබලන් වී ඇති අවස්ථාවල සේවයේ ප්‍රමාදවීම් ඇති විය හැකිය.

## අන්තර්ජාලය (Internet) මගින් තොරතුරු ලබා ගැනීම



පාඨක අවශ්‍යතා අනුව අන්තර්ජාලය (Internet) මගින් තොරතුරු ගවේෂණය සඳහා පහසුකම් සපයා තිබෙන අතර ඒ සඳහා පැයක කාල සීමාවකට ස්ථිර සාමාජිකයෙකුගෙන් රු. 40.00 ක් ද එක් දින සාමාජිකයකුගෙන් රු. 50.00 ක මුදලක් ද අය කරනු ලැබේ.

## පරිගණක පිටපත් ලබාගැනීම



අන්තර්ජාලය හෝ සංයුක්ත තැටි ගවේෂණය මගින් අවශ්‍ය තොරතුරු මුද්‍රිත පිටපත් ලෙස ලබා ගන්නේ නම් ඒ සඳහා අය කරන මිල ගණන් පහත පරිදි වේ.

| | **එක් දින සාමාජිකයින් සඳහා** | **ස්ථිර සාමාජිකයින් සඳහා** |
|---|---|---|
| ලේසර් තනි පැත්ත | රු. 12.00 | රු. 10.00 |
| ලේසර් දෙපැත්ත | රු. 18.00 | රු. 15.00 |
| සාමාන්‍ය තනි පැත්ත | රු. 9.00 | රු. 7.00 |
| සාමාන්‍ය දෙපැත්ත | රු. 10.00 | රු. 8.00 |

## ස්කෑන් පිටපත් ලබා ගැනීම

| | **A4 ප්‍රමාණය** |
|---|---|
| තනි පිටුවක් ස්කෑන් කිරීම | රු. 10.00 |
| ස්කෑන් කරන ලද ලේසර් පිටපතක් | රු. 25.00 |
| ස්කෑන් කරන ලද සාමාන්‍ය පිටපතක් | රු. 15.00 |
| ස්කෑන් කරන ලද වර්ණ පිටපතක් (Colour Printout) | රු. 110.00 |

## සත්‍ය පිටපතක් බවට සහතික කිරීමේ ගාස්තුව

නිල ලාංඡනය සහිතව සහතික කළ පිටපතක් ලබා දීම සඳහා

මුල් පිටුවට රු. 100.00

වැඩිවන පිටුවකට - පළමු අමතර පිටු 04 ට

පිටුවකට රු. 25.00 බැගින් රු. 100.00

සම්පූර්ණ පිටු සංඛ්‍යාව පිටු 05 කට වැඩිවන අවස්ථාවල දී

එක් පිටුවකට රු. 10.00


## අමතර අයකිරීම් - පුවත්පත් හා ගැසට් පරිහරණය

### පුවත්පත්



එක් දිනක දී සාමාන්‍ය පරිදි මාස 05 ක පුවත්පත් පරිශීලනය සඳහා ගාස්තුවක් අය නො කෙරෙන අතර ඊට අතිරේක සෑම මාසයක ම පුවත්පත් පරිශීලනය සඳහා රු. 25.00 ක් බැගින් සේවා ගාස්තුවක් අය කරනු ලැබේ.

### ගැසට්



එක් දිනක දී සාමාන්‍ය පරිදි මාස 05 ක ගැසට් පරිශීලනය සඳහා ගාස්තුවක් අය නො කෙරෙන අතර ඊට අතිරේක සෑම මාසයක ම ගැසට් පරිශීලනය සඳහා රු. 25.00 ක් බැගින් සේවා ගාස්තුවක් අය කරනු ලැබේ

## නෛතික කටයුතු සඳහා පුවත්පත් හා රජයේ ප්‍රකාශනවල ඡායා පිටපත් නිකුත් කිරීම



පුවත්පත් ආඥා පනතේ 04 වන වගන්තියට අනුව මහජනතාවගේ නෛතික අවශ්‍යතා සඳහා වූ සහතික කරන ලද පිටපත් සැපයීමේ වගකීම පොත් සහ පුවත්පත් රෙජිස්ට්‍රාර් කාර්යාලය ලෙස ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව සතු වේ. ජාතික පුස්තකාලයට අදාළ 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතට අනුව ඒ සඳහා වගකීම ජාතික පුස්තකාලය සතු නො වේ.

## පුවත්පත් එකතුව පරිහරණය පිළිබඳ උපදෙස්

පුවත්පත්, විශාල පෙට්ටිවල ආරක්ෂිතව රාක්ක මත තැන්පත් කර ඇති බැවින් පාඨකයින්ගේ ඉල්ලීම් අනුව ලබා ගැනීමේ දී හා ආපසු තැන්පත් කිරීමේ දී විශාල ශ්‍රමයක් වැය වේ. එබැවින් පුවත්පත්වලට ඇති ඉල්ලුමේ ප්‍රමාණය සහ එදින සේවය කරන නිලධාරි සංඛ්‍යාව අනුව පාඨකයින් සඳහා පුවත්පත් සැපයීමේ ප්‍රමාදයන් ඇති වීමට ඉඩ තිබේ. සාමාන්‍ය තත්වයන් යටතේ වුව ද පාඨකයින්ගේ පරිහරණය සඳහා විශාල පුවත්පත් ප්‍රමාණයක් එකවර නිකුත් කිරීම අපහසු වේ. තමන්ට අවශ්‍ය තොරතුරු ඇතුළත් පුවත්පතේ නම, දිනය වැනි මූලික තොරතුරු රැගෙන පැමිණීම අදාළ තොරතුරු ඉක්මනින් ලබා ගැනීමටත් අනවශ්‍ය පුවත්පත් පරිශීලනය වළක්වා ගැනීමටත් මහෝපකාරී වේ



ජාතික පුස්තකාලය සතු පුවත්පත් එකතුව පාඨක ඔබගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් විවෘතව පවතින්නකි. එය අද දින ඔබ සඳහා මෙන්ම අනාගත පරපුර වෙනුවෙන් ද ආරක්ෂා විය යුතු වේ.

මෙම පුවත්පත් මාස අනුපිළිවෙලට පෙට්ටිවල තැන්පත් කර ඇත. එම පෙට්ටි රාක්කවලින් පිටතට ගැනීමත්, ආපසු තැන්පත් කිරීමත්, අවුල් වූ පුවත්පත් නැවත

සකස් කිරීමත්, ඉතාමත් වෙහෙසකර හා කාලය වැයවන කාර්යයකි. එබැවින් ඔබට අවශ්‍ය පුවත්පත් පිළිබඳ තොරතුරු නිවැරදිව ඉදිරිපත් කොට අවශ්‍ය පුවත්පත් පමණක් ලබා ගැනීමට කාරුණික වන්න.

පසුගිය වසර ගණනාවක පුවත්පත්වල පළ වූ ලිපි පිළිබඳ තොරතුරු ඇතුළත් පුවත්පත්ලිපි අනුක්‍රමණිකා (Newspaper Article Index) අප විසින් සම්පාදනය කර ඇත. ඒවා පරිශීලනය කිරීමෙන් තමන්ට අවශ්‍ය තොරතුරු හඳුනාගෙන පසුව අදාළ පුවත්පත් පමණක් පරිශීලනය කළ හැක. මෙම පුවත්පත් අනුක්‍රමණිකා පිළිබඳ තොරතුරු කාර්ය මණ්ඩලයෙන් ලබාගත හැක.

මෙම වටිනා එකතුව පරිහරණයේ දී පුවත්පත්වලට හානි සිදුවන ආකාරයෙන් පරිහරණය කිරීම, පිටු ඉරා ගැනීම හෝ රැගෙන යාමෙන් වළකින මෙන් කාරුණිකව දන්වමි. එසේ ම පුවත්පත් ආපසු භාරදීමේ දී ඒවා අවුල් නොකොට පිටු නියමිත පිළිවෙලට සකසා භාරදීම විශාල පහසුවක් වේ.

පුවත්පත් හෝ වෙනත් පුස්තකාල ද්‍රව්‍යවලට හානිකරන හෝ සොරකම් කරන පාඨකයන්ගේ ජාතික පුස්තකාල සාමාජිකත්වය අවලංගු කිරීමටත්, ඔවුන් නීතිය ඉදිරියට පැමිණවීමටත් සිදුවන බව කාරුණිකව සලකන්න.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පර්යේෂණ හා විමර්ශන කටයුතු සඳහා කැප වී ඇති පුස්තකාලයකි. පොදුවේ ජාතික පුස්තකාලය වෙත පැමිණෙන සියලුම පාඨකයින් හට උසස් සහ කාර්යක්ෂම සේවාවක් සැපයීම එහි ප්‍රධාන අරමුණ වේ.

ISBN 978-955-8383-61-2

## National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Boar

1. Place of Scanning : National Library and Documentation Services Boar
2. Date Scanned : 2017/10/23
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottaw
   Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under the norms and standards of digital scanning accurately, also keeping with document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Off

Name : Iromi Wijesundara